# 18 වන දවස

## ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවේවා !
## ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා !

විශ්වයේ ආරම්භය ඉබේම ඇතිවූවක් නොවේ. එහි ගමන් මඟ යම් සැලැස්මක් කරා ගමන් කරයි. එම අරමුණ හා සැලැස්ම සර්වබලධාරි දෙවි මහෝත්තමයාණන්ගේ ය. මේ බව ශු. බයිබලයේ ආරම්භක පොත වන උත්පත්ති පොත අපට ගෙනහැර පායි. කුමන බාධක අභියෝග ආව ද (පාපය නිසා) ඔවුන් වහන්සේගේ මෙම සැලැස්ම අරමුණ කරා ගමන් කරවයි. මිනිසාගේත් විශ්වයේත් ඉරණම රඳා පවතිනුයේ දෙවිඳුන් අතේ බැවින් ඔවුන් වහන්සේගේ පාලනය පිළිගෙන, ඔවුන් වහන්සේ සරණ ගොස් දේව කැමැත්ත අනුව ජීවත්වීම මිනිසාගේ කැඳවීමයි. ''ඔබ රිසි දේ කරනු වස් මෙන්න මම ඇවිත් සිටිමි'' (හෙබ්‍රෙව් 10:7) වදාරමින් මිනිසා වෙනුවෙන් හා දෙවිඳුන් වෙනුවෙන් මෙම සැලැස්ම පූර්ණ කිරීම කිතු සමිඳාණන්ගේ දූත මෙහෙය විය.

**''ව්‍යවස්ථාව අනුව ඔප්පු කරන පුද පඬුරු වලටත්, දවන පූජාවලටත්, පාප පූජාවලටත් ඔබ කැමති වන්නේවත් සතුටු වන්නේවත් නැතැයි ඉහත කියා මෙන්න ඔබගේ කැමැත්ත කරන්නට මම පැමිණ සිටිමි''යි** ක්‍රිස්තුන් වහන්සේ දෙවනුව වදාළ සේක (හෙබ්‍රෙව් 10:8-9).

බාහිර වත් පිළිවෙත් පුද පූජාවලට වඩා තමන් වහන්සේගේ මුළු ශරීරයෙන්, හදවතින් හා අභ්‍යන්තරයෙන් දේව කැමැත්ත දැන ගැනීම, ඉටු කිරීම හා පූර්ණ කිරීමට ක්‍රිස්තුන් වහන්සේ කැප වූ සේක.

**දවස පුරා :-**
- ✵ ඔබගේ කැමැත්ත ඉටු කරන්නට
  මේ මොහොතේ කුමක්ද කියා අසන්නට
  නිතර නිතර ම අසන්නට පෙළඹුව මැනවි මා
  දෙවි පියාණෙනි
- ✵ හෙබ්‍රෙව් 10:1-10
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 222